[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 5 දරන පස්යොදුන්රට සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 මාර්තු මස 26 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 මාර්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල රු.4.50 යි    තැපැල් ගාස්තුව රු.3.50 යි.

**1999 අංක 5 දරන පස්යොදුන්රට සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1999 මාර්තු මස 26 වැනි දින]

එල්. ඩී. - ඕ. 30/97.

**"පස්යොදුන්රට සංවර්ධන පදනම" සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"පස්යොදුන්රට සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟවන රීති අනුව එකී පදනමට සම්බන්ධ සියලුම කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් මතුගම පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවණු ලැබූයේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් හා එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 1999 අංක 5 දරන පස්යොදුන්රට සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන පස්යොදුන්රට සංවර්ධන පදනමේ දැනට සිටින තාක් සාමාජිකයන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, "පස්යොදුන්රට සංවර්ධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකිය. තව ද පොදු මුද්‍රාවක් තබාගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. පස්යොදුන්රට සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) සමාජ පදනමක් ඇති කුමන හෝ සංවිධාන ප්‍රවර්ධනය කිරීම;

(ආ) එවැනි සංවිධානවල හැකියාව වැඩි දියුණු කිරීම;

(ඇ) අඩු වරප්‍රසාද ඇති ජන කොටස්වල අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම;

(ඈ) සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම;

(ඉ) සෞඛ්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම හා මන්දපෝෂණය තුරන්කිරීම පිළිබඳ තොරතුරු සපයා දීම;

(ඊ) අඩු වරප්‍රසාද ලත් ජන කොටස්වල ශුභසාධනය හා සංවර්ධනය වැඩිදියුණු කිරීම;

(උ) ග්‍රාමීය ප්‍රදේශවල මෙන්ම වතුකරයේ ආදායම් ජනනය වන ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම හා රැකියා අවස්ථා ඇති කරනු වස් ස්වයං රැකියා ව්‍යාපෘති දියත් කිරීම;

(ඌ) ගංවතුර, සුළිසුළං, නියඟ වැනි ස්වභාවික විපත්වලින් ආපදා සිදු වූ අවස්ථාවල දී සහන ලබාදීම;

(එ) පොත්පත් සහ පත්‍රිකා ආදිය බෙදාදීම මගින් හා සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන සහ චිත්‍රපටි දර්ශන පැවැත්වීම මගින් කෘෂිකර්මාන්තය, උද්‍යාන විද්‍යාව, ජලජීව විද්‍යාව, පටපණු කර්මාන්තය, සත්ව පාලනය, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය, සහ මී මැසි පාලනය පිළිබඳ වඩා දියුණු ක්‍රම සම්බන්ධ දැනුම හා තොරතුරු බෙදාහැරීම ; සහ

(ඒ) අඩු වරප්‍රසාද ලත් ජනයින් අතර සහසුරුවම්කම වර්ධනය කිරීම;

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පර්මාර්ථ

ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීමේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වූ කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී නිල දැරූ පදනමේ කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් විශ්‍රාම ගැනීම හෝ ඔවුන් නෙරපීම සම්බන්ධයෙන් ද, කළමනාකරණ මණ්ඩලයේ නිලධරයන් තෝරා පත් කර ගැනීම සඳහා ද කළමනාකරණ මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් සහ සංස්ථාවේ රැස්වීම්වල කටයුතු කර ගෙන යෑමේ කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින්, කලින් කල සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන, රීති සෑදීම නීත්‍යානුකූල වන්නේය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි වන්නේය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති පදනමේ රීති මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූලව නොවන තාක් දුරට, ඒ රීති මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තා හ.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පැවති සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපිත සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවි යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර, සංස්ථාවේ රීතිවලට යටත්ව ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදුදීමට, හුවමාරු කිරීමට හෝ අන් ආකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය

9. කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී තැනැත්තන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

10. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.